# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

---

**[සහතිකය සටහන් කළේ 2010 සැප්තැම්බර් මස 09 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2010 සැප්තැම්බර් මස 09 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 12.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

# දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

[සහතිකය සටහන් කළේ 2010 සැප්තැම්බර් මස 09 වන දින]

එල්.ඩී.—ඕ. 19/2010

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත දහඅට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ලෙස හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

(1) එකී ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව ඉවත් කිරීමෙන්; සහ

(2) එකී ව්‍යස්ථාවේ (3අ) (අ) (i) වන අනුව්‍යවස්ථාවේ—

(අ) "තම ප්‍රථම ධුර කාලය ආරම්භ වී අවුරුදු හතරක් ඉකුත්වීමෙන් පසු යම් අවස්ථාවක," යන වචන වෙනුවට, "තම වත්මන් ධුර කාලය ආරම්භ වී අවුරුදු හතරක් ඉකුත්වීමෙන් පසු යම් අවස්ථාවක," යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) "ජනාධිපතිවරයා විසින් ප්‍රකාශ කරනු ලැබිය හැක්කේ ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:—

"ජනාධිපතිවරයා විසින් ප්‍රකාශ කරනු ලැබිය හැක්කේ ය:

එසේ වුව ද, මේ ව්‍යවස්ථාව ප්‍රකාර තවත් ධුර කාලයක් සඳහා ජනාධිපතිවරයා තෝරා පත්කරගනු ලැබූ අවස්ථාවක, ඔහු එසේ තෝරා පත්කරගනු ලැබිය හැකි යම් තදනන්තර ධුර කාලයක් සඳහා මේ ව්‍යවස්ථාවේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 32 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**3.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 32 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (3) වන අනුව්‍යවස්ථාව ඉවත් කර සහ ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්:—

"(3) ජනාධිපතිවරයා ස්වකීය ධුරයෙහි බලය ප්‍රකාර මාස තුනකට එක් වරක් පාර්ලිමේන්තුවට සහභාගි විය යුත්තේ ය. මේ කර්තව්‍යය ඉටුකිරීමේ දී ඡන්දය පාවිච්චි කිරීමට ඇති හිමිකම හැර පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු සතු සියලු වරප්‍රසාද, පරිහාර සහ බලතලවලට ජනාධිපතිවරයා හිමිකම් ලබන අතර, පාර්ලිමේන්තුව හෝ එහි මන්ත්‍රීවරුන් හෝ සතු යම් වරප්‍රසාද කඩකිරීමක් සම්බන්ධයෙන් වගකිව යුතු නොවන්නේ ය."; සහ

(2) එහි (3) වන අනුව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුව්‍යවස්ථාව ඇතුළත් කිරීමෙන්:—

"(4) ස්වකීය ධුරයෙහි බලය ප්‍රකාර පාර්ලිමේන්තුව ඇමතීමට ද, පාර්ලිමේන්තුවට සංදේශ යැවීමට ද, ජනාධිපතිවරයාට අයිතිය තිබිය යුත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIIඅ පරිච්ඡේදය ඉවත් කිරීම.

**4.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIIඅ පරිච්ඡේදය (41අ සිට 41උෟ ව්‍යවස්ථාව දක්වා) මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ අලුත් ව්‍යවස්ථාව ඇතුළත් කිරීම.

**5.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 වන ව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ශීර්ෂය සහ ව්‍යවස්ථාව ඇතුළත් කරනු ලබන අතර එය එහි ශීර්ෂය සහ 41අ ව්‍යවස්ථාව ලෙස බලපැවැත්විය යුතු ය:—

"VII අ පරිච්ඡේදය

විධායකය

පාර්ලිමේන්තු සභාව

ජනාධිපතිවරයා විසින් උපලේඛනවල සඳහන් කොමිෂන් සභා සහ ධුර සම්බන්ධයෙන් පත්කිරීම් සිදුකරනු ලැබිය යුතු බව.

41අ. (1) මේ ව්‍යවස්ථාවේ I වන උපලේඛනයේ සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරයා සහ සාමාජිකයන් ද, මේ ව්‍යවස්ථාවේ II වන උපලේඛනයේ I වන කොටසේ සහ II වන කොටසේ සඳහන් ධුරවලට පත්කළ යුතු තැනැත්තන් ද, ජනාධිපතිවරයා විසින් එකී උපලේඛනවල සඳහන් කොමිෂන් සභාවලට සහ ධුරවලට පත්කරනු ලැබිය යුත්තේ ය. ජනාධිපතිවරයා විසින් එකී පත්කිරීම් සිදුකිරීමේ දී—

(අ) අග්‍රාමාත්‍යවරයා;

(ආ) කථානායකවරයා;

(ඇ) විරුද්ධ පක්ෂයේ නායකවරයා;

(ඈ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විය යුතු, අග්‍රාමාත්‍යවරයාගේ නාමිකයකු; සහ

(ඉ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විය යුතු, විරුද්ධ පක්ෂයේ නායකවරයාගේ නාමිකයකු,

යන අයගෙන් සමන්විත (මේ ව්‍යවස්ථාවේ මින්මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පාර්ලිමේන්තු සභාවක නිරීක්ෂණ ඉල්ලා සිටීම කළ යුත්තේ ය:

එසේ වුව ද, ඉහත (ඈ) සහ (ඉ) ඡේද ප්‍රකාර පත්කරනු ලබන නාමිකයන්, ඉහත (අ), (ආ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව සඳහන් තැනැත්තන් අයත් වන ජන කොට්ඨාස නොවන්නා වූ ජන කොට්ඨාසවලට අයත්වන බව සහතිකවන ආකාරයට නම් කළ යුත්තේ ය.

### I වන උපලේඛනය

1. මැතිවරණ කොමිෂන් සභාව.
2. රාජ්‍ය සේවා කොමිෂන් සභාව.
3. ජාතික පොලිස් කොමිෂන් සභාව.
4. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
5. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව.
6. මුදල් කොමිෂන් සභාව.
7. සීමා නිර්ණය කොමිෂන් සභාව.

### II වන උපලේඛනය

#### I වන කොටස

1. අග්‍රවිනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්.
2. අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ විනිශ්චයකාරවරුන්.
3. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා හැර අනෙකුත් සාමාජිකයන්.

#### II වන කොටස

1. නීතිපතිවරයා.
2. විගණකාධිපතිවරයා.
3. පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්).
4. පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් සතියක කාලයක් ඇතුළත, ඒ නම් කිරීම් සිදු කරන මෙන්, අග්‍රාමාත්‍යවරයාට සහ විරුද්ධ පක්ෂයේ නායකවරයාට, කථානායකවරයා විසින් නියම කරනු ලැබිය යුත්තේ ය: එසේ වුව ද, අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා, ඒ නම් කිරීම් සිදු කිරීම පැහැර හැරියහොත්, මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ අතුරු විධානයේ නිශ්චිතව දක්වා ඇති උපමාන සැලකිල්ලට ගනිමින්, (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ) සහ (ඉ) ඡේදවල කාර්ය සඳහා නාමිකයන් වශයෙන් පාර්ලිමේන්තුවේ යම් මන්ත්‍රීවරුන් නම් කිරීමට කථානායකවරයා විසින් කටයුතු කරනු ලැබිය යුත්තේ ය.

(3) ඉහත නිශ්චිතව දක්වා ඇති පරිදි ජනාධිපතිවරයා විසින් සභාවේ නිරීක්ෂණ විමසනු ලබන අවස්ථාවේ දී, සභාවේ ඔවුන්ගේ නාමිකයන් විය යුතු තැනැත්තන් කවරහු ද යන්න නම් කිරීම අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා විසින් පැහැර හැර තිබේ නම්, මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ අතුරු විධානයේ නිශ්චිතව දක්වා ඇති උපමාන සැලකිල්ලට ගනිමින්, (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ) සහ (ඉ) ඡේදවල කාර්ය සඳහා නාමිකයන් වශයෙන් පාර්ලිමේන්තුවේ යම් මන්ත්‍රීවරුන් නම් කිරීමට කථානායකවරයා විසින් කටයුතු කරනු ලැබිය යුත්තේ ය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 64 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ කවර විධිවිධානයක් තිබුණ ද, එය නොතකා පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ දී, ඉහත කී ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු කථානායකවරයා ලෙස තෝරා පත්කරගනු ලබන තෙක් කථානායකවරයා, මේ ව්‍යවස්ථාවේ කාර්ය සඳහා කථානායකවරයා ලෙස නොකඩවා කටයුතු කළ යුත්තේ ය. ඉන්පසු අලුත් කථානායකවරයා ඉහත සඳහන් සභාවේ සාමාජිකයකු විය යුත්තේ ය.

(5) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුව ද, ඉන් ඉක්බිතිව පවත්වනු ලබන මහ මැතිවරණයකින් පසු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකවරයා ලෙස පිළිගනු ලබන තෙක් විරුද්ධ පක්ෂයේ නායකවරයා, මේ වගන්තියේ කාර්ය සඳහා, විරුද්ධ පක්ෂයේ නායකවරයා ලෙස නොකඩවා ධුරය දැරිය යුත්තේ ය. ඉන්පසු අලුත් විරුද්ධ පක්ෂයේ නායකවරයා ඉහත සඳහන් සභාවේ සාමාජිකයකු විය යුත්තේ ය.

(6) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුව ද, එය නොතකා ඉන් ඉක්බිතිව පවත්වනු ලබන මහ මැතිවරණයකින් පසු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවට තෝරා පත්කරගනු ලබන තෙක්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වූ, අග්‍රාමාත්‍යවරයාගේ නාමිකයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයාගේ නාමිකයා සභාවේ සාමාජිකයන් ලෙස නොකඩවා කටයුතු කළ යුත්තා හ. ඉන්පසු අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා විසින් මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ) සහ (ඉ) ඡේද ප්‍රකාර ඔවුන්ගේ නාමිකයන් ලෙස අලුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙදෙනකු පිළිවෙලින් නම් කරනු ලැබිය යුත්තේ ය.

(7) මේ ව්‍යවස්ථාව යටතේ සංස්ථාපිත සභාවේ නිල කාලය 62 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ නිශ්චිතව සඳහන් යම් කාලයක් සඳහා දීර්ඝ විය යුත්තේ ය. තව ද, එම නිල කාලය කෙරෙහි, 70 වන ව්‍යවස්ථාව ප්‍රකාර පාර්ලිමේන්තුව වාරාවසාන කිරීමක් මඟින් බලපෑමක් ඇති නොවිය යුත්තේ ය:

එසේ වුව ද, ජනාධිපතිවරයා විසින් එකී නිල කාලය තුළ දී පිළිවෙලින් අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා විසින් නාමිකයන් ලෙස පත් කරනු ලැබූ තැනැත්තන් ඉවත් කිරීම හෝ එකී නාමිකයකුගේ අශක්නුතාවක් ඇති අවස්ථාවක, සභාවේ ඔහුගේ නාමිකයා ලෙස වෙනත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නම් කරන ලෙස ජනාධිපතිවරයා විසින් අවස්ථාවෝචිත

පරිදි, අග්‍රාමාත්‍යවරයාට හෝ විරුද්ධ පක්ෂයේ නායකවරයාට නියම කිරීම හෝ කරනු ලැබිය හැක්කේ ය. එවැනි අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඉවත් කිරීම හෝ අශක්නුතාව හෝ හේතුවෙන් නිර්මාණය වූ පුරප්පාඩුව පිරවීම සඳහා නම් කරනු ලැබූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විසින්, ඔහු නම් කරනු ලැබුවේ යම් සාමාජිකයකුගේ පුරප්පාඩුවක් පිරවීම සඳහා ද, සභාවේ එකී සාමාජිකයාගේ ඉකුත් නොවූ කාල පරිච්ඡේදය සඳහා පමණක් එකී සභාවේ එවැනි සාමාජිකයකු ලෙස නොකඩවා කටයුතු කළ යුත්තේ ය.

(8) ජනාධිපතිවරයා විසින් මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ I වන උපලේඛනයේ සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරු සහ සාමාජිකයන් ද, II වන උපලේඛනයේ I වන කොටසේ සහ II වන කොටසේ සඳහන් ධුරවලට තැනැත්තන් ද, පත්කිරීමේ කාර්යය සඳහා (1) වන අනුව්‍යවස්ථාවේ සඳහන් සභාවේ නිරීක්ෂණ විමසනු ලබන අවස්ථාවක දී, තමන් විසින් එකී පත්වීම් සඳහා යෝජනා කරනු ලැබූ තැනැත්තන් පිළිබඳ සභාවේ නිරීක්ෂණ, එකී විමසීමේ දින සිට සතියක කාලපරිච්ඡේදයක් තුළ කථානායකවරයා මඟින් තමන්ට දන්වන ලෙස සභාවට නියම කරනු ලැබිය යුත්තේ ය. එකී සභාව විසින් එහි නිරීක්ෂණ එසේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ කාලය තුළ දැන්වීම පැහැර හැරියහොත්, ජනාධිපතිවරයා විසින් වහා ම එකී පත්වීම් සිදු කිරීමට කටයුතු කළ යුත්තේ ය.

(9) පාර්ලිමේන්තුව තුළ නියෝජනය වන්නා වූ යම් පිළිගත් දේශපාලන පක්ෂයක නායකයකු විසින් මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ I වන උපලේඛනයේ සඳහන් යම් කොමිෂන් සභාවක සභාපතිවරයා හෝ සාමාජිකයකු හෝ ලෙස යම් තැනැත්තකුගේ නම යෝජනා කිරීමට අපේක්ෂා කරනු ලබන අවස්ථාවක දී, ඔහු විසින්, ඉහත නිශ්චිතව සඳහන් කරනු ලැබූ සතියක කාල පරිච්ඡේදය තුළ එයට අදාළව යම් තැනැත්තකුගේ නම කථානායකවරයාට ඉදිරිපත් කළ යුත්තේ ය. එවැනි පත්වීම් කරනු ලබන විට ජනාධිපතිවරයා විසින් එකී නම් සැලකිල්ලට ගනු ලැබිය යුත්තේ ය.

(10) මේ ව්‍යවස්ථාවේ I වන උපලේඛනයේ සඳහන් කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයකු ලෙස පත්කරනු ලැබූ යම් තැනැත්තකු හෝ මේ ව්‍යවස්ථාවේ II වන උපලේඛනයේ I වන කොටසේ සහ II වන කොටසේ සඳහන් ධුරවලට පත්කරනු ලැබූ යම් තැනැත්තකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට හෝ එකී කාර්යය සඳහා පනවන ලද වෙනත් යම් නීතියකින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට හෝ හැර ඉවත් නොකළ යුත්තේ ය. එවැනි විධිවිධාන සලස්වා නොමැති අවස්ථාවක එකී තැනැත්තා, ජනාධිපතිවරයා විසින් ඉවත් කළ යුත්තේ ය.

(11) (1) වන අනුව්‍යවස්ථාවේ (අ), (ආ), (ඇ), (ඈ) සහ (ඉ) ඡේදවල නිශ්චිතව සඳහන් තැනැත්තන්ගේ නිරීක්ෂණ ලබා ගැනීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය කථානායකවරයා විසින් නිශ්චය කරනු ලැබිය යුත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**6.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52 වන ව්‍යවස්ථාව, එහි (7) වන අනුව්‍යවස්ථාවේ "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව ද," යන වචන වෙනුවට "රාජ්‍ය සේවා කොමිෂන් සභාව ද," යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**7.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (1) වන අනුව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්:—

"(1) ජනාධිපතිවරයා විසින් පත්කරනු ලබන නව දෙනකුට නොවැඩි සාමාජිකයන්ගෙන් සමන්විත (මේ පරිච්ඡේදයේ "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් විය යුතු අතර, එකී සාමාජිකයන් අතරින් සාමාජිකයන් තිදෙනකුට නොඅඩු සංඛ්‍යාවක් රජයේ නිලධරයන් වශයෙන් අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති තැනැත්තන් විය යුත්තා හ. ජනාධිපතිවරයා විසින් ඒ සාමාජිකයන්ගෙන් එක් සාමාජිකයකු එහි සභාපතිවරයා ලෙස පත්කරනු ලැබිය යුත්තේ ය.";

(2) එහි (4) වන අනුව්‍යවස්ථාවේ "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත්කරනු ලැබුවහොත් හෝ" යන වචන වෙනුවට "ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එහි (7) වන අනුව්‍යවස්ථාවේ "තාවකාලික සාමාජිකයකු වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත පත්කරනු ලැබිය යුත්තේ ය." යන වචන වෙනුවට "තාවකාලික සාමාජිකයකු වශයෙන් පත්කරනු ලැබිය යුත්තේ ය." යන වචන ආදේශ කිරීමෙන්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 වන ව්‍යවස්ථාව ප්‍රතියෝජනය කිරීම.

**8.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 වන ව්‍යවස්ථාව, මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ව්‍යවස්ථාව ආදේශ කරනු ලැබේ:—

"අමාත්‍ය මණ්ඩලයේ සහ කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍ය.

55 (1) අමාත්‍ය මණ්ඩලය විසින්, රජයේ නිලධරයන් පත්කිරීම, උසස් කිරීම, මාරුකිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය සහ ඔවුන් සේවයෙන් පහකිරීම ඇතුළු, රජයේ නිලධරයන්ට අදාළ සියලු ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්විය යුත්තේ ය.

(2) සියලු දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත්කිරීම, උසස් කිරීම, මාරුකිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය සහ ඔවුන් සේවයෙන් පහකිරීම අමාත්‍ය මණ්ඩලය වෙත පැවරෙන්නේ ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, රජයේ නිලධරයන් පත්කිරීම, උසස් කිරීම, මාරුකිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය සහ ඔවුන් සේවයෙන් පහකිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරෙන්නේ ය.

(4) නීතියෙන් පිහිටුවන ලද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවල බලතල සහ කර්තව්‍ය කොමිෂන් සභාව විසින් හීන කරනු නොලැබිය යුත්තේ ය.

(5) කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අනුකූලව කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට වගකිව යුතු සහ

උත්තර දිය යුතු අතර, එක් එක් ලිත් වර්ෂයේ දී සිදු කරන ලද ස්වකීය කටයුතු පිළිබඳ වාර්තාවක් ඒ වර්ෂය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය.”.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**9.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56 වන ව්‍යවස්ථාව එහි (1) වන අනුව්‍යවස්ථාවේ “කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන” යන වචන වෙනුවට “අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**10.** ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවේ 57 වන ව්‍යවස්ථාව එහි (1) වන අනුව්‍යවස්ථාවේ, “කොමිෂන් සභාව විසින් නිශ්චිතව නියම කරන” යන වචන වෙනුවට “අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චිතව නියම කරන” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61ඉ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**11.** ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවේ 61ඉ ව්‍යවස්ථාව එහි (ආ) අනුව්‍යවස්ථාව ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

“(ආ) නීතිපතිවරයා පත් කිරීම ද,”.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61ඊ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**12.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61ඊ ව්‍යවස්ථාව එහි “රජයේ නිලධරයා” යන යෙදුමේ අර්ථ නිරූපණයෙහි ඇති “ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පත් කරන ලද පොලිස් නිලධරයකු” යන වචන අත්හැරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**13.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (1) වන අනුව්‍යවස්ථාවේ “ජනාධිපතිවරයා විසින් 41ඇ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව පත් කරනු ලබන්නේ ය.” යන වචන සහ ඉලක්කම් වෙනුවට “ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන්නේ ය.” යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (6) වන අනුව්‍යවස්ථාවේ, “41ඇ ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව තැනැත්තකු පත් කිරීමට ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය.” යන වචන සහ ඉලක්කම් වෙනුවට “තැනැත්තකු පත් කිරීමට ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය.” යන වචන ආදේශ කිරීමෙන්.

**14.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91 වන ව්‍යවස්ථාව, එහි (1) වන අනුව්‍යවස්ථාවේ (ඈ) (Vආ) ඡේදය ඉවත් කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**15.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 92 වන ව්‍යවස්ථාව, එහි (ඇ) අනුව්‍යවස්ථාව ඉවත් කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 92 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**16.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

(1) එහි (1) වන අනුව්‍යවස්ථාවේ—

(අ) "සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත විය යුත්තේ ය." යන වචන වෙනුවට "සාමාජිකයන් තුන් දෙනකුගෙන් සමන්විත විය යුත්තේ ය.";

(ආ) "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ඔවුන් අතුරෙන්" යන වචන වෙනුවට "ඔවුන් අතරින්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (7) වන අනුව්‍යවස්ථාවේ "ඒ නිවාඩු කාල සීමාව සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් පත්කරනු ලැබිය හැක්කේ ය. ඒ සෑම පත්කිරීමක් ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත විය යුත්තේ ය." යන වචන වෙනුවට "ඒ නිවාඩු කාල සීමාව සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් පත්කරනු ලැබිය හැක්කේ ය." යන වචන ආදේශ කිරීමෙන්.

**17.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

(1) එහි (4) වන අනුව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ඇතුළත් කිරීමෙන්:

"(4අ) කොමිෂන් සභාව විසින්, අවස්ථාවෝචිත පරිදි, මැතිවරණයක් පැවැත්වීම සඳහා නියමයක් කරනු ලබන දිනය සමඟ හෝ ජනමත විචාරණයක් පැවැත්වීම නියම කරමින් ප්‍රකාශනයක් කරනු ලබන දිනය සමඟ හෝ ආරම්භ වන කාල පරිච්ඡේදය තුළ නිකුත් කරනු ලබන යම් උපමාන—

(අ) අවස්ථාවෝචිත පරිදි, අදාළ මැතිවරණය පැවැත්වීම සමඟ හෝ අදාළ ජනමත විචාරණය පැවැත්වීම සමඟ හෝ ඍජුව සම්බන්ධ වූ කාරණාවලට පමණක් සීමා විය යුතු බව; සහ

(ආ) රාජ්‍ය සේවයට අදාළ යම් කාරණයකට හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලැබූ, අවස්ථාවෝචිත පරිදි, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ අධිකරණ සේවා කොමිෂන් සභාවේ පරිපාලන සීමාව ඇතුළත වූ යම් කාරණයකට හෝ සෘජුව සම්බන්ධ නොවිය යුතු බව,

සැක දුරුකිරීම සඳහා මෙයින් සඳහන් කරනු ලැබේ.”; සහ

(2) එහි (5) වන අනුව්‍යවස්ථාවේ (ආ), (ඇ) සහ (ඈ) ඡේද ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

“(ආ) යම් ගුවන්විදුලි සේවයක් හෝ රූපවාහිනී සේවයක් පවත්වාගෙන යන්නකු හෝ යම් ප්‍රවෘත්ති පත්‍රයක අයිතිකරුවකු නැතහොත් ප්‍රකාශකයකු හෝ විසින් (අ) ඡේදය යටතේ ඔවුන් වෙත නිකුත් කරනු ලැබූ යම් උපමාන පිළිපැදීම සහතික කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම, අවස්ථාවෝචිත පරිදි, එකී ගුවන්විදුලි සේවය හෝ රූපවාහිනී සේවය පවත්වාගෙන යන්නාගේ හෝ ප්‍රවෘත්ති පත්‍රයේ අයිතිකරුගේ නැතහොත් ප්‍රකාශකයාගේ හෝ කාර්යය වන්නේ ය.”.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ඉ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**18.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ඉ ව්‍යවස්ථාව, එහි (1) වන අනුව්‍යවස්ථාවේ “ඒ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව” යන වචන වෙනුවට “ඒ මැතිවරණ කොමසාරිස්වරයා” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**19.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වන ව්‍යවස්ථාව, එහි (1) වන අනුව්‍යවස්ථාවේ “41ඇ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත් ව ජනාධිපතිවරයා විසින් ස්වකීය අත්සන යටතේ වූ අධිකාර පත්‍රයක් මගින් පත් කරනු ලබන්නා හ.” යන වචන සහ ඉලක්කම් වෙනුවට “ජනාධිපතිවරයා විසින් ස්වකීය අත්සන යටතේ වූ අධිකාර පත්‍රයක් මගින් පත් කරනු ලබන්නා හ.” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**20.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 109 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 109 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

(1) එහි (1) වන අනුව්‍යවස්ථාවේ "ජනාධිපතිවරයා විසින්, 41ඇ ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව," යන වචන සහ ඉලක්කම් වෙනුවට "ජනාධිපතිවරයා විසින්," යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (2) වන අනුව්‍යවස්ථාවේ "ජනාධිපතිවරයා විසින් 41ඇ ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව පත් කරනු ලැබිය හැක්කේ ය." යන වචන සහ ඉලක්කම් වෙනුවට "ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැක්කේ ය." යන වචන ආදේශ කිරීමෙන්.

**21.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඇ ව්‍යවස්ථාව, එහි (1) වන අනුව්‍යවස්ථාවේ "41ඇ ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව ජනාධිපතිවරයා විසින්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ජනාධිපතිවරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඇ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**22.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඉ ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඉ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

(1) එහි (5) වන අනුව්‍යවස්ථාවේ "කොමිෂන් සභාවේ තාවකාලික සාමාජිකයකු වීමට, ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත," යන වචන වෙනුවට "කොමිෂන් සභාවේ තාවකාලික සාමාජිකයකු වීමට" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (6) වන අනුව්‍යවස්ථාවේ "ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත," යන වචන වෙනුවට "ජනාධිපතිවරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන්.

**23.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

(1) එහි (1) වන අනුව්‍යවස්ථාවේ "41ඇ ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව ජනාධිපතිවරයා විසින් පත්කරනු

ලබන්නේ ය." යන වචන සහ ඉලක්කම් වෙනුවට "ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන්නේ ය." යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (4) වන අනුව්‍යවස්ථාවේ "41ඈ ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට යටත්ව ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය." යන වචන සහ ඉලක්කම් වෙනුවට "ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය." යන වචන ආදේශ කිරීමෙන්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**24.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව එහි "රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ" යන වචන වෙනුවට "රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**25.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ ව්‍යවස්ථාව, එහි (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ) ඡේදයේ "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් තිදෙනෙක්" යන වචන වෙනුවට "ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් තිදෙනෙක්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155අ ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**26.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155අ ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1) එහි (1) වන අනුව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්:—

"(1) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් හත් දෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත (මේ පරිච්ඡේදයේ "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික පොලිස් කොමිෂන් සභාවක් තිබිය යුත්තේ ය. ජනාධිපතිවරයා විසින් එක් සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය.";

(2) එහි (4) වන අනුව්‍යවස්ථාවේ "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ" යන වචන වෙනුවට "ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ" යන වචන ආදේශ කිරීමෙන්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 155ඊඊ සහ155ඊඊඊ අලුත් ව්‍යවස්ථා ඇතුළත් කිරීම.

**27.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඊ ව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ව්‍යවස්ථා ඇතුළත් කරනු ලබන අතර, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඊඊ සහ 155ඊඊඊ යන ව්‍යවස්ථා ලෙස බලපැවැත්විය යුතු ය:—

"කොමිෂන් සභාවේ බලතල.

155ඊඊ. පොලිස් නිලධරයකුට හෝ පොලිස් බලකායට එරෙහිව ජනතා සාමාජිකයන්ගෙන් හෝ අතෘප්තියට පත් යම් තැනැත්තකුගෙන් හෝ ලැබෙන පැමිණිලි භාරගැනීම සහ ඒ පිළිබඳ විමර්ශනය කිරීම සඳහා කොමිෂන් සභාවට බලතල ලබාදිය යුතු අතර, පාර්ලිමේන්තුව මගින් පනවන ලද යම් නීතියක විධිවිධානවලට අනුකූලව ඒ සම්බන්ධයෙන් සහන සැලසිය යුතු වන්නේ ය. මේ කාර්යය සඳහා කොමිෂන් සභාව විසින්, ජනතා සාමාජිකයන්ගෙන් හෝ යම් අතෘප්තියට පත් තැනැත්තකුගෙන් ලැබෙන පැමිණිලි භාරගැනීම සඳහා සහ විමර්ශනය කිරීම සඳහා කාර්ය පටිපාටි ස්ථාපිත කිරීමට රීති සාදනු ලැබිය හැකි වන්නේ ය.

කොමිෂන් සභාව රීති සෑදිය යුතු බව.

155ඊඊඊ. කොමිෂන් සභාව විසින්, රීති සෑදීම නියමිත වන්නා වූ යම් කාරණා සම්බන්ධයෙන්, කලින් කල, රීති සෑදීම කළ යුත්තේ ය. එකී සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කළ යුත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ ව්‍යවස්ථාව ඉවත් කිරීම.

**28.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඌ ව්‍යවස්ථාව ඉවත් කිරීම.

**29.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඌ ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155එ ව්‍යවස්ථාව ඉවත් කිරීම.

**30.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155එ ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඒ ව්‍යවස්ථාව ඉවත් කිරීම.

**31.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඒ ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඔ ව්‍යවස්ථාව ඉවත් කිරීම.

**32.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඔ ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඕ ව්‍යවස්ථාව ප්‍රතියෝජනය කිරීම.

**33.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඕ ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන ව්‍යවස්ථාව ආදේශ කරනු ලැබේ:—

"දැනට බලපවත්නා රීති සහ නියෝග ශේෂ කිරීම.

155ඕ. මේ ව්‍යවස්ථාව ආරම්භ වන දිනයේ දී පොලිස් නිලධරයන්ට අදාළව බලාත්මකව පවතින සියලු රීති, නියෝග සහ කාර්ය පටිපාටි, මෙය යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රීති, නියෝග සහ කාර්ය පටිපාටි සාදනු ලබන තෙක්, නොකඩවා බලාත්මකව පැවතිය යුත්තේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**34.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (2) වන අනුව්‍යවස්ථාවේ "41ඇ ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, ජනාධිපතිවරයා විසින් පත්කරනු ලැබිය යුත්තේ ය." යන වචන සහ ඉලක්කම් වෙනුවට "ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුත්තේ ය." යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (5) වන අනුව්‍යවස්ථාවේ "41ඇ වන ව්‍යවස්ථාවට යටත්ව, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුත්තේ ය." යන වචන සහ ඉලක්කම් වෙනුවට "ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුත්තේ ය." යන වචන ආදේශ කිරීමෙන්.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**35.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාව, එහි "රජයේ නිලධරයා" යන යෙදුමේ අර්ථ නිරූපණයේ (ඇඅ) අනුව්‍යවස්ථාව ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**36.** සැක දුරුකිරීම සඳහා මෙසේ ප්‍රකාශ කරනු ලැබේ:— සැක දුරුකිරීම.

(1) මේ පනත ආරම්භ වීමට පෙරාතුව වූ දිනයේ දී ධුර දරන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඇ වන ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කරනු ලැබූ අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වූ දින සිට සහ ඉන් පසුව, එවැනි සාමාජිකයන් ලෙස නොකඩවා ධුර දැරිය යුතු අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ කොමිෂන් සභාව වෙත පවරනු ලැබ ඇති බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ යුත්තේ ය.

(2) මේ පනත ආරම්භ වීමට පෙරාතුව වූ දිනයේ දී ධුර දරන අග්‍රවිනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙනත් විනිශ්චයකාරවරුන් ද, අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ වෙනත් විනිශ්චයකාරවරුන් ද, මහාධිකරණයේ විනිශ්චයකාරවරුන් ද, මේ පනත ආරම්භ වූ දින සිට සහ ඉන්පසු නොකඩවා ධුර දැරිය යුතු අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඔවුන් වෙත පවරනු ලැබ ඇති බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ යුත්තේ ය.

(3) මේ පනත ආරම්භ වීමට පෙරාතුව වූ දිනයේ දී අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා ලෙස, නීතිපතිවරයා ලෙස, විගණකාධිපතිවරයා ලෙස, පොලිස්පතිවරයා ලෙස, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්) ලෙස සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා ලෙස ධුර දරන තැනැත්තන් මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සහ ඉන්පසු නොකඩවා ධුර දැරිය යුතු අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඔවුන් වෙත පවරනු ලැබ ඇති බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ යුත්තේ ය.

(4) මේ පනත ආරම්භ වීමට පෙරාතුව වූ දිනයේ දී මැතිවරණ කොමසාරිස්වරයා ලෙස ධුර දරන තැනැත්තා, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට සහ ඉන්පසුව නොකඩවා ධුරය දැරිය යුතු අතර, 103 වන ව්‍යවස්ථාව ප්‍රකාර මැතිවරණ කොමිෂන් සභාවක් සංස්ථාපනය කරනු ලබන තෙක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

යටතේ මැතිවරණ කොමසාරිස්වරයා ලෙස ඔහු වෙත පවරනු ලැබ ඇති බලතල සහ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම කළ යුතු අතර, මැතිවරණ කොමිෂන් සභාව සංස්ථාපනය කිරීමේ දින සිට සහ ඉන් පසුව ඔහු මැතිවරණ කොමසාරිස්වරයා ලෙස ධුර දැරීම අවසන් වන්නේ ය:

එසේ වුව ද, ජනාධිපතිවරයා විසින්, එසේ කිරීම යෝග්‍ය යයි හෝ අවස්ථාවේ අත්‍යවශ්‍යභාවය අනුව එසේ කිරීම අවශ්‍ය යයි හෝ සලකනු ලබන්නේ නම් මැතිවරණ කොමිෂන් සභාව සංස්ථාපනය කිරීමට පෙරාතුව කවර හෝ වේලාවක, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් කොමිෂන් සභාව වෙත වර්තමානයේ පවරනු ලැබ ඇති කර්තව්‍ය ඉටුකිරීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයාගේ ධුරයට අතිරේක මැතිවරණ කොමසාරිස්වරයකු හෝ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්වරයකු ලෙස ධුර දරන තැනැත්තකු පත්කරනු ලැබිය හැක්කේ ය.

(5) මේ පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව වූ දිනයේ දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIIඅ පරිච්ඡේදය යටතේ ස්ථාපිත ජාතික පොලිස් කොමිෂන් සභාව ඉදිරියේ නොවිසඳී පවත්නා පොලිස් නිලධරයන්ගේ පත්වීම්, උසස්කිරීම්, ස්ථාන මාරු, එකී නිලධරයන් විෂයයෙහි විනය පාලනය සහ සේවයෙන් පහකිරීම්වලට අදාළ සියලු කාරණා මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසු රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු විය යුතු අතර, යම් පොලිස් නිලධරයකු විසින් මේ පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත කරන ලද නොවිසඳී පවත්නා යම් අභියාචනා මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරිය යුතු අතර, ඒ අනුව විසඳා අවසන් කළ යුතු වන්නේ ය.

(6) මේ පනතේ ඉහතින් වූ වගන්තිවල විස්තර කරන ලද කොමිෂන් සභා සහ නිලධරයන් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ඉවත් කරනු ලැබීමට පෙරාතුව කරනු ලැබූ සියලු පත්කිරීම් එකී සභාවේ ධුර කාලය අවසන් වූ

දිනය සහ මේ පනතත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය අතර කාලය තුළ වලංගු සහ බලාත්මක ලෙස සලකනු ලැබිය යුත්තේ ය.

(7) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය රාජ්‍ය සේවයේ සාමාජිකයන් විය යුතු අතර, රාජ්‍ය නිලධරයකුගේ පදවියක් සම්බන්ධයෙන් එවැනි නිලධරයකුට අදාළ විය යුතු රීතිවලට යටත් විය යුත්තේ ය.

(8) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාර මැතිවරණ කොමිෂන් සභාව පත් කිරීමේ දින සිට සහ ඉන් පසුව, මැතිවරණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIVඅ පරිච්ඡේදයේ කාර්යය සඳහා එකී කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු අතර, යම් මැතිවරණයක් හෝ ජනමත විචාරණයක් පවත්නා කාලය සඳහා අවශ්‍ය වන කවර හෝ අවස්ථාවක එම කාර්ය මණ්ඩලය ලේකම් කාර්යාලයක කර්තව්‍ය ඉටු කළ යුතු වන්නේ ය.

**37.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.